වසර දහයක දිග ගමනක්

සන්නස දසවසරක අභිමානය හෙට දවසේ මාධ්‍ය වගකීම "සන්නස"

වසර දයකට පෙර පත්තර පිටු කීපයකින් සමන්විතව මෙල්බන් නුවරින් මෙලොව එළිය දුටු "සන්නස" පත්තරය මේ සමරන්නේ ඇගේ දසවන උපන් දිනයයි .එදා පුංචි පැලයක් වූ සන්නස අද වෙනකොට මහා වෘක්ෂයක්ව අතු රිකිළි ලා වැඩී ඇත. පළමුව පාඨකයකු ලෙසත් දෙවනුව "සන්නස" ආපු මග පුංචි කොටස් කරුවෙකු ලෙසත් "සන්නස" ට සුබ පතන්නේ හද පිරි සතුටිනි .

"සන්නස" නුබ ආ මග කෙටිය ,ඒ ආ මග රළුය ,සීත කබා නොතිබුන බව සැබෑය, නමුත් යායුතු දුර බොහෝය මන්ද එය අද දවසේ වගකීමකට වඩා හෙට දවසේ වගකීමක් වන හෙයිනි .

"සන්නස නුඹේ දස වසරක සැමරුම ලියන මම නුඹේ සියවසරක සැමරුම ලියන්න මෙලොව නොසිටින බව හොඳා කාරවම දනිමි, ලෝක ස්වභාවය එයය. නමුත් නුඹ ඒ සියවසද සැමරිය යුතුය මන්ද තොරතුරු පිපාසාවෙන් පෙලෙනවුන්ගේ පිපාසය නුඹ අද මෙන්ම එදාටත් සන්සිඳවිය යුතු බැවිනි. නුඹව මෙ ලෝකයට ජාතක කල උන්, නුඹව මේ ලෝකයට වැදු උන්, නුඹව අදටත් හදා බලා කියා ගන්නවුන් නුඹෙන් බලා පොරොත්තුවූත් හෙට දවසේදීත් බලාපොරොත්තුවන එකම පැතුමද එයම වන බැවිනි .

මෙලොව එළිය දකින සෑම සත්වයෙකුටම ස්වභාව දහම විසින් පැවරුද රාජකාරියක් ඇත. එය අපි එදිනෙදා කරන අපගේ පොද්ගලික ක්‍රියාකාරකම් වලින් ඔබ්බට ගිය සමාජමය රාජකාරියකි. නමුත් මෙන්න මේ කරුණ නිවැරදිව තේරුම් ගත්ත වුන් ඉතා අල්පය. සන්නස කියන අදහස, නැතිනම් සමාජ සත්කාරය පිළිබඳව වූ පළමු වස්තු බීජයද උපදින්නේ මෙන්න මේ තමන්ගේ සමාජමය වගකීම පිළිබඳව තිවැරදි තක්සේරුවක සිටි පුද්ගලයින් කීප දෙනෙකු තුලය. ඔවුන් නම් අතර ජගත්.ජේ.එදිරිසිංහ , අසෝක සුබසිංහ, සාළිය ගලප්පත්ති සහ ආනන්ද ය. ඉතින් පත්තරයේ මුල්ම කතෘ වූ ජගත්.ජේ .එදිරිසිංහයන් මේ ආ ගමන ගැන තොරතුරු කීවේ මෙන්න මේ ආකාරයටයි .

සන්නස පත්තරය ආරම්භවෙන්නට ප්‍රථම ඕස්ට්‍රේලියාවේ පළවුණේ පත්තර දෙකක් පමණයි. ඒ එකක් සෙරන්ඩිබ් ඉංග්‍රීසි පත්තර සහ අනෙක පහන සිංහල පුවත්පත පමණයි. ඔස්ට්‍රේලියාවේ මාධ්‍යවේදියෙකු ලෙස මම මගේ ගමන ආරම්භ කරනුයේ ඇත්තටම සෙරන්ඩිබ් ඉංග්‍රීසි පුවත් පත සමගිනි. ඒ සෙරන්ඩිබ් පත්තරයේ සිංහල අතිරේකය ආරම්භ කරමින්. ඒ ඇත්තටම මිට වසර දාහතකට දහඅටකට වගේ ඉහතදීයි. පසුව තමයි මම වරුණ සාවින්දත් සමග එක්ව පහන පත්තරය ආරම්භ කරන්නේ. කෙසේ නමුත් කාලයත් එක්ක පහන පත්තරයෙන් මම ඉවත්වනවා. පහනින් ඉවත්වන්නට සිදුවීමේ කළකිරීම නිසා නැවත කිසිදිනෙක පුවත්පත් හා සම්බන්ධ නොවන්නට මම තීරණය කරගෙන සිටියා

ඉතින් ඔන්න ඔහොම ඉන්න කොට තමයි මේ සන්නස ගැන යෝජනාව අරන් එන්නේ, අශෝක සුහසිංහයි , සාළිය ගලප්පතියි සමග ආනන්ද කුමාරසිරි. සන්නස කියන මුල්ම සංකල්පයේ අයිතිකරුවන් වනුයේ මා අර පෙර පැවසූ පිරිසයි. එය මගේ පොද්ගලික සංකල්පයක් නොවෙයි. ඒ ගෞරවය ඔවුන්ට සැමදාම ලැබිය යුතුයි. මන්ද මම පහන පත්තරයෙන් ඉවත් වුයේ ඇත්තටම ආපසු ඕස්ට්‍රේලියාවේ පුවත්පත් වලට සම්බන්ධ නොවන බවට මටම පොරොන්දුවක් දීගෙනයි. නමුත් සාළිය සහ අශෝක තමයි මේ වැඩේ කොහොමහරි කරන්න ඕන කියන කාරණය මගේ මණස තුල පැල පදියම් කළේ. ඔහොම කොහොම කොහොම හරි අපි වැඩේ පටන්ගත්තා කියමුකෝ, ඒ හරියටම 2005 අද වගේ අප්‍රේල් මාසයකයි .

සන්නස බිගිකිරීමේ මුලිකම අරමුණ උනේ ඇත්තටම මෙහි වෙසෙන ලිවීමේ හැකියාවක් ඇති , නැත්නම් කෙටියෙන්ම කිවහොත් අදහස් ප්‍රකාශ කිරීමේ පිපාසයෙන් පෙලෙන වුන්ට වේදිකාවක් තනාදීම කියන කාරණයයි. එහිදි අපි සැමවිටම බැලුවේ ලියන පුද්ගලයාගේ අදහස කුමක් වුවත් ඔහු හෝ ඇය සමාජ ගත කරන කරුණ සමාජයේ යහ පැවැත්මට කරන බලපෑම කෙතරම් දුරට සාධාරණද කියන කාරණයම පමණයි. විවිධ වූ අදහස් ඇති , විවිදධ වූ දේශපාලන මතිමතාන්දර ඇති ,විවිධ වූ සමාජ දැක්මවල් ඇති පිරිස් අපත් සමග වැඩකරනවා . අපි සැමවිටම ඔවුන්ගේ මතයට ගරුකරමින් ඔවුන් සියලුදෙනාටම වේදිකාවක් තනා දීමම තමයි අද වෙනකල් මේ කරගෙන යන්නේ . මේ හැමදේම අපි කරන්නේ මාධ්‍ය කලාවේ සදාචාරය සහ හෙගි නිර්මාණයකයන්ට හානියක් නොවන ආකාරයටයි . මෙහිදී මම කියන්න කැමති ,අපේ මේ උත්සාහය නිසා බොහෝ හැකියා ඇති පිරිසකට එළියට එන්න ,එහෙම නැත්තනම් තම හැකියාවන් උපන් ගෙයිම වල නොදා ලෝකයට දීමට හැකියාවක් ලැබුනා . ඇත්තට සන්නස ඔවුන්ට වේදිකාවක් වුනා . මාධ්‍ය කරුවකු විදිහට මම පොද්ගලිකව ඉතාම සතුටු වෙනවා මෙන්න මේ කාරණය ගැන. මොකද ඊළඟ පරම්පරාවට මාධ්‍යකරුවෙක් විදිහට මට දෙන්න පුළුවන් හොදම දේ අන්න එකයි . හරියට අර "හොඳම දේ දරුවන්ටයි" කියනව වගේ, ඊළඟ පරම්පරාවට අපිට දෙන්න පුළුවන් හොදම දේ තමයි ඔවුන්ගේ හැකියාවන් පිළිබිඹු කිරීමට හැකි වේදිකාවක් තනාදීම කියන කාරණය .

සමහර පක්ෂවාදී සහ ගෝත්‍රවාදී කොටස් වලට මෙන්න මේ නිදහස් අදහස් ප්‍රකාශ කිරීමේදී නැගෙන චෝදනාවලට මුහුණදීමේ හැකියාවක් නොමැති කම හමුවේ, එහෙමත් නැත්නම් තමන් දරන මතයට වඩා වෙනස් මතයක් කෙනෙක් ඉදිරිපත් කිරීමේදී එය දරා ඉන්න හැකියාවක් නැති කම හමුවේ අපි මේ කරගෙන යන වැඩ කොටස නොයෙක් තර්ජන සහ බාධා කිරීම් වලින් නවතන්නට පවා උත්සහ කළා. සමහර වෙලාවල් වලදී මෙන්න මේ කාරණය නිසාම අපිට යම් යම් අපහසුතාවයන්ට පවා මුහුණදීමට සිදුවුවා. මා ඒ අවස්ථා මොනවාද කියා මෙතැනදී කියන්න යන්නේ නෑ. නමුත් එවැනි දේවලුත් සිදු නොවෙනවා ම නොවෙයි .

ආපසු හැරි බලද්දී පත්තරය අද තියෙන තත්වය පිළිබඳව නිහතමාණිව මා සතුටු වෙනවා . අපිට අදවෙනකම් වෙනමම පත්රයටම කියල කාර්යාලයක් නැහැ .පත්තරය සකසන්නේ අපි, එය සංස්කරණය කරන්නේ අපි ,පිටු හදන්නෙත් අපි ,පත්තරය මුද්‍රණයට අරන් යන්නෙත් අපි ,අපහු රෑ දොළහට එකට මුද්‍රණාලයෙන් පත්තර ගෙනෙන්නත් අපි ,පත්තර මිටි බඳින්නෙත් අපි ,පත්තර අරගෙන ගිහින් කඩයක් කඩයක් ගානේ දාන්නෙත් අපි .ඉතින් මේක හරි ලේසි පහසු කටයුත්තක් නෙමෙයි .මේ සඳහා විශාල කාලයක් සමග විශාල මූල්‍යමය පරිශ්‍රමයක් දරන්න සිදු වනවා .සමහර වෙලාවකට හිතෙනවා ඇති දැන් මේ කළා කියලා .කොහොම උනත් මාසේ අන්තිම වෙද්දී හිතෙනවා අනේ මිනිස්සු පත්තරේ බලාගෙන ඉන්නවා නේද කියලා .මේක ඇත්තටම දැන් අපේ ජීවිතේ කොටසක්ම වෙලා .බොහෝ වෙලාවට අපි අපේ පෞද්ගලික කටයුතු බොහෝ මග හැර ගෙන තමයි මේ කටයුතු කරන්නේ .මොකටද මම වත් අශෝකවත් අපිත් එක්ක වැඩ කරන කිසිවෙකුත් පූර්ණ කාලීන මාධ්‍යවේදීන් නොවෙයි .අපි සියලුදෙනාම වෙනත් රාජකාරියක නියුතුවෙන ගමන් තමයි මේ සමාජ සත්කාරයට පණ පොවන්නේ . මම අවංකවම කියන්න කැමති අද වනතෙක් මේ පත්තරයෙන් අපි කවුරුත් මූල්‍යමය ප්‍රතිලාභයක් ලබාගෙන නැහැ .අපිට මේ මාසේ ලැබෙන අදායමෙන් තමයි ලබන මාසේ පත්තරයේ මුද්‍රණ කටයුතු සිදුවන්නේ . නමුත් අපි වටා තියෙන ශක්තිමත් පවුර තමයි මේ පත්රසයට ලියන පිරිස .ඔවුන් තමා අපගේ සාර්ථකත්වයේ රහස .ඒක හරියට ඉහල ගිය "පිරමීඩයක ශක්තිමත් පාදමය" වගේ .ඉතින් මේ අපවටා සිටින පිරිස නැතිනම් , ශක්තිමත් පදානම මත තමයි සන්නස නොසැලී ඉහලට යන්නේ .

අවසාන වශයෙන් මම කැමති සන්නසට පසුගිය වසර දහය තුල අකුරක් හරි ලියල, නැත්නම් චිත්‍රයක් ,කවියක් හෝ කුමන නිර්මාණයකින් සන්නස ගමන් මගට රුකුළක් වුණු සියලුදෙනාටම මගේ හදවතින් ම නැගෙන ස්තූතිය පිරිනමන්න .ම්ම ඉස්සෙලා කිව්වා වගේම මේ ආපු ගමනේ සැබෑ ගිම්කරුවන් ඔවුන්ය .එසේම අපගේ ගමනට මූල්‍යමය වශයෙන් ශක්තියදෙන සියලුම සේවා ධායකයින්ටත් මම මේක අවස්ථාවක් කරගන්නවා මගේ ස්තූතිය පිරිනමන්න .

ජගත්ගෙන් සමුගත් මා සන්නස ගැන තවත් බොහෝද දන්න අශෝක දෙසට හැරුනේ ජගත් කියපු දේවල් වලට අමතරව සන්නස ගැන කියන්න අශෝ කටත් බොහෝදේ තියෙන බව දන්නා කියන නිසාය

අශෝක ,ජගත් කියන විදිහට සන්නස කියන මූල බීජයේ හිම්කරුවන්ගෙන් කෙනෙකු ලෙස අද වෙනකන්ම සන්නස සමග සිටින සන්නසේ ප්‍රධාන භූමිකාවක් හොබවන අනිත් පුද්ගලයා ඔබයි .කොහොමද සන්නස සමග ඔබේ ගණුදෙනුව පටන්ගන්නේ .

පත්තරයක් කරන්න ඕන කියන කාරණය ගැන පලමුවෙන්න්ම කතා කරන්න ගත්තේ මමත් සාළිය ගලප්පත්ති සහා අපේ මිත්‍ර ආනන්ද කුමාරසිරිත් එකතුවයි .අපි ඉතින් ඔය සති අග සාදි වලදී වගේ හමු උනාම මේ පත්රතයක අවශ්‍යතායව ගැන නොයෙක් විට කථා කලා .නමුත් අපිට හරි හැටි වැටහීමක් තිබුනේ නැහැ කොහොමද මේ වැඩේ පටන්ගන්නේ සහ කොහොමද මේක කරගෙන යන්නේ කියන කාරණය.

ඔන්න ඔහොම ඉන්න අතරේදී තමයි අපිට ජගන්ව මුණ ගැසෙන්නේ .ජගත් ඒ වෙනකොට වෙනත් පත්තර කීපයක් සමග වැඩ කරලා හොඳ පල පුරුද්දක් ඇතුවයි සිටියේ .නමුත් අපිට තිබුන මූලිකම ගැටලුව උනේ අපි කොහොමද ජගත්ව මේ කටයුත්තට කැමති කර ගන්නේ කියන කාරණයයි .මොකද ඒ වෙනකොට ජගත් තීරණයක් අරගෙන තිබුනේ, ආපසු මේ පත්ර කලාවත් සමග කිසිම ම ගණුදෙනුවක් නොකරණ බවට. අපි කිහිප වරක්ම ජගත්ව මුණ ගැසුනා ,අපි ජගත් සමග කථාකළා මේ කාරණය පිළිබඳව ,ඇත්තටම අපේ කරදරේටම තමයි ජගත් මේ වැඩේට එකඟ උනේ .කොහොම හරි අපේ අදහස මල් ඵල ගැන්වුනේ මිට වසර දහයකට පෙර මේ වගේම අප්‍රේල් මාසයකයි .

සන්නස බිගි වුයේ ඇත්තටම ඕස්ට්‍රේලියාවේ වෙසෙන සිංහල ප්‍රජාවේ හැකියාවන්ට වේදිකාවක් තනාදිය යුතුය කියන සංකල්පය පෙරදැරිකර ගෙනයි . මොකද ඒවෙනකොට අපි දුටුවා මේ බොහෝ දක්ෂතාවන් තියෙන ,කවීන් ,චිත්‍රශිල්පීන් ,ලේඛකයින් , ඒ වගේම නිදහස් මතධාරීන් ,තමන්ගේ හැකියාවන් ,තමගේ අදහස් සමාජයට මුසුකරන්නට ,නැතිනම් සමාජගත කිරීමට අවශ්‍ය වේදිකාවක් නැති කමින් බොහෝ අපහසුතාවන්ට පත්වන අයුරු. ඉතින් සන්නස මගින් අපි උත්සාහ කළෙත් දැනටත් අපි කරන කාරණය මේ හැකියාව ඇති වුන්ට වේදිකාවක් වෙමින් ඔවුන්ගේ නිර්මාණ වලට සමාජ ගතවෙන්න අවැසි ඉඩප්‍රස්තාව ලබාදීම පමණයි.

මෙහිදී විවිධ සමාජ ස්ථරවල විවිධ අදහස් ඇති ,විවිධ දේශපාලනමය මතිමතාන්තර ඇති පුද්ගලයින් ඔවුන්ගේ අදහස් ,නිර්මාණ සන්නස ඔස්සේ සමාජයට ලබාදෙනවා . සමහර විට ඔබ සන්නසේ යන දේශපාලනමය ලිපි දෙකක් කියවුවහොත් එහි ඇති අදහස් දෙක පරස්පර විරෝධී වෙන්න පුළුවන් . නමුත් අපි පත්තරයක් විදිහට බලන්නේ ඔවුන් දෙදෙනාටම අවශ්‍ය අවස්ථාව ලබාදීමම පමණයි .මෙන්න මේ කරුණ නිසයි සන්නස අනෙකුත් පත්තර වලට වඩා වෙනස් වෙන්නේ .සන්නසට දේශපාලනමය න්‍යාය පත්‍රයක් නෑ .සන්නස කාගේවත් පක්ෂයකවත් , කාගේවත් ශාකා සමිතියකවත් මතය සමාජ ගත කරන්න උත්සහ ගන්නා "වැළ යන පැත්තට මැස්ස ගසන" ජාතියේ පත්තරයක් නොවෙයි.

සන්නසට සමාජයේ තියෙන පිළිගැනීම නිසාම තමයි සන්නස 2005 වසරේ සිටම මුද්‍රත මාධ්‍යයට අමතරව අන්තර්ජාල මාධ්‍යයෙනුත් ජනතාව අතරට යාමට මං සලසා ගන්නේ .එතෙක් මෙතෙක් සන්නස ආ ගමන් මග සන්නස අන්තර්ජාලයට එක්වීම සන්නස ලැබූ විශාලතම ජයග්‍රහණයක් ලෙසයි මා දකින්නේ .ඒ හැමදේකටම බලපෑවේ පාඨකයා සහ අපි අතර පවතින අනොන්‍ය විශ්වාසයයි .ඇත්තට අද වෙනකොට සන්නස අන්තර්ජාලය හරහා කියවන වැඩි පිරිස ඕස්ට්‍රේලියාවෙන් පිතට සිටියි එය කියවන්නේ .පත්තරයේ කොටස්කරුවෙකු ලෙස මා ඉතාම නිහතමානිව සතුටු වෙනවා අද සන්නස ලබා තිබෙන මේ ප්‍රගතිය පිළිබඳව

සන්නස ආරම්භයේ සිටම සන්නස තුල අපි මුල් තැනක් දෙන්න උත්සහ කලේ කලාව සමග බැඳී බොහෝවිට කලාකාමී ලිපි සහ පුවත් වලටයි .මන්ද ඒ තුලින් තමයි අලුත් ලේඛකයින් ,අලුත් කවීන් ,අලුත් කාටූන් ශිල්පීන් බිහිකළ හැක්කේ කියන මතයේ අපි හිටිය නිසා .බොහෝ සන්නස පාඨකයි න් අප සමග පවසන දෙයක් තමයි සන්නසේ කියවන්න යමක් තියෙනවා .සන්නසේ අදහස් අලුත් කියන කාරණය .

සන්නස මෙතෙක් ආපු ගමන ඉතාම දුෂ්කර ගමනක් . මේ ගමනේදී ජගත් සහ මා අතර ඇති අනොන්‍ය විශ්වාසය නිසාම මේ ගමන ආවා මිසක ,නැතිනම් සන්නස ලත්තැහැම ලොජ්වි හමාරයි . සන්නසට අදටත් කාර්යාලයක් නැහැ .සියලුම කටයුතු කරන්නේ අපි කීප දෙනෙක් විසින්. අපිට තියෙන මූලිකම ශක්තිය තමයි සන්නසට හරවත්දේ ලියන , රසවත් නිර්මාණ ධායාදු කරන සන්නස සමග හිබඳවම සිටින මේ නිර්මාණ කරුවන් පිරිස. ඔවුන් තමයි සන්නස මෙතෙක් ආ ගමනේ ශක්තිය .ඇත්තටම මම ඒ සියලුදෙනාටම සන්නසට වසර දහයක් පිරෙන මේ මොහොතේ මගේ ස්තූතිය පිළිගන්වනවා .එසේම අපිට වෙළඳ දැන්වීම් ලබාදෙමින් මූල්‍යමය ශක්තිය ලබා දෙන සියලුම ආයතන වලටත් මේ අවස්ථාවේදී මගේ ස්තූතිය මම පිළිගන්වනවා .